Department of Education Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය : පෙරදිග සංගීතය**

**සතිය : 27 වන සතිය**

**ශ්‍රේණිය : 06**

**සකස් කිරීම** : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

## කෙළි ගී (මේවර කෙළිය)

**මේවර කෙළිය**

සාර සදිසි පෙති පේර නෙළන කල වළ ගිය දෝ මගෙ — මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත — මේවරයා
කොස් වතු කන්දේ කොස් කඩනා දා වළ ගිය දෝ මගෙ — මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත — මේවරයා

මුං වතු කන්දේ මුං නෙළනා දා වළ ගිය දෝ මගෙ — මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත — මේවරයා
කහ වතු කන්දේ කහ කොටනා දා වළ ගිය දෝ මගෙ — මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත — මේවරයා

කොටන පොලන කොට පොල් අඹරන කොට වළ ගිය දෝ මගෙ — මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත — මේවරයා
කැලේ ගොහිල්ලා දර කඩනා කල වළ ගිය දෝ මගෙ — මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත — මේවරයා

## හිස්තැන් පුරවන්න.

1) මේවර කෙළිය යනු ............................. ක්‍රීඩාවකි.
2) මේවර කෙළිය යනු.............................වර්ධනය කරනු ලබන ක්‍රීඩාවකි.
3) මෙම ක්‍රීඩාව........................................ සඳහා සුවිශේෂී වූ ක්‍රීඩාවකි.
4) මේවරය යනු....................................... බව පුරාණ ග්‍රන්ථවල සඳහන් වී ඇත.
5) නැතිවූ මේවරය....................................නැවත නැවත විමසීම මෙම ගීතවල දැකිය හැකිය.

**(සාමූහිකත්වය/කර්ණාභරණයක්/ජන/කාන්තාවන්/නෑනාවරුන්ගෙන්)**